# කැටයම් කලාවේදී සුවිශේෂී ස්ථානයක් හිමි වූ හස්තියා

ඉන්දු රාමනායක *

*Elephas maximus* යන සත්ත්ව විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන අලියා නැතහොත් හස්තියා සිව්පා සතුන් අතර සුවිශේෂී ස්ථානක් හිමිකර ගනී. ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ ද හස්තියා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආගමික වශයෙන් වැදගත් වූ බවට සාහිත්‍ය මූලාශ්‍ර මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ද සාක්ෂි දරයි. අලියා විවිධ අංශයන් යටතේ මානවයා හා සම්බන්ධ වී ඇති අතර විවිධ කාර්යයන් සඳහා අලියා යොදාගෙන ඇත. මෙහිදී අවධානයට යොමු වන කැටයම් කලාවේදී හස්තියා නිර්මාණකරණයේදී සුවිශේෂී ස්ථානයක් ලැබී ඇති බව මූලාශ්‍ර අධ්‍යයනය කිරීමේදී හඳුනා ගැනීමට හැකි වේ.

සිංහල කලා සැරසිලි සඳහා අලි ඇතුන් භාවිතා කර තිබෙන අතර විහාරස්ථාන, රජ මාලිගා හා පාෂාණමය නිර්මාණයන් මුල් කරගෙන කැටයම් කලාව සඳහා අලියා යොදාගැනීමට පැරණි කලාකරුවන් සමත් වී තිබේ. ලී කැටයම්, ඇත්දත් කැටයම්, ගල් කැටයම්, වාත්තු කැටයම් හා පිත්තල කැටයම් ආදිය සඳහා යොදාගනු ලැබූ අතර එයින් අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසා හා අලි ඇතුන් අතර පැවති සහසම්බන්ධතාවය මනාව අවබෝධ කරගත හැකිවේ. කැටයම් කලාවේදී හස්තියා භාවිතා කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමේදී මුල් යුගයේ සිට දේශීය හා විදේශීය වශයෙන් ඇත්දත් කර්මාන්තයට විශේෂ ස්ථානයක් හිමි වූ බවත් ඇත් දත් භාවිතය තුළින් විවිධ කැටයම් නිර්මාණය කිරීම උදෙසා කලාකරුවා යොමු වී ඇති බවත් හඳුනා ගැනීමට හැකිය. ආර්ථික වශයෙන් ද ඇත් දත් කර්මාන්තය එදා මෙදාතුර ප්‍රධාන ස්ථානයක් හිමි කරගෙන ඇති ආකාරයත් ඇත් දත් භාවිතා කිරීම තුළින් ප්‍රභූත්වය පෙන්වීම හා සෞභාග්‍යය උදාකර ගැනීමත් ආදී කරුණු බලපා ඇත. ලී කැටයම් හා ගල් කැටයම් භාවිතා කිරීම තුළින් ද ආගමික, සංස්කෘතික ආර්ථික හා සමාජීය ගොඩනැගිලි මෙන්ම කලා කෘති මුල් කරගෙන හස්තියා යොදාගෙන ඇති ආකාරය දැකිය හැකිය.

හස්තියා පිළිබඳව ග්‍රන්ථ රචනා වී පැවතිය ද කැටයම් කලාව තුළ හස්තියා යොදාගැනීම පිළිබඳව විධිමත් පර්යේෂණයක් සිදුවී නොමැති අතර මෙම පර්යේෂණ පත්‍රිකාව තුළදී ශ්‍රී ලාංකීක සංස්කෘතිය තුළ හස්තියා කැටයම් කලාවෙහිදී යොදාගෙන ඇති ආකාරය, හස්තියා යොදාගැනීම සඳහා භාවිතා කරන ලද උපක්‍රම ආදි පුළුල් පරාසයක් පවතින ක්ෂේත්‍රය තුළින් එයින් ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ. විශේෂයෙන් ලී කැටයම්, ගල් කැටයම්හි හස්තියා නිර්මාණය කර ඇති ආකාරයත්, ඇතුන්ගේ දළ භාවිතා කරමින් සිදු කරන ලද විවිධ නිර්මාණයන් කෙරෙහි ද මෙහි දී විමර්ශනයට ලක් වේ.

මුඛ්‍ය වචන - හස්තියා, ලී කැටයම්, ඇත්දත් කැටයම්, ගල් කැටයම්, ශ්‍රී ලාංකීක, කලාව

* **රාමනායක, ආර්. බී. එම්. අයි. පී. කේ. ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, පුරාවිද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා නිලධාරි, ප්‍රධාන කාර්යාලය, මධ්‍යම සංස්කෘතික අරමුදල**